වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2024

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிறுவனம்

National Institute of Language Education and Training

අන්තර්ගතය

ආයතනික සාරාංශය	01
ආයතනයේ අරමුණු	02
කළමනාකරණ මණ්ඩලය	03
අධ්‍යයන මණ්ඩලය	04
සභාපතිතුමියගේ පණිවිඩය	05
මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂීතා	06
ආයතනික ව්‍යුහය	08
ආයතනික පාලනය	11
ආයතන කාර්ය මණ්ඩලය	12
භාෂාව, සංස්කෘතිය සහ සහජීවනය	13
ඩිජිටල්කරණය	15
2024 වර්ෂයේ ඉලක්ක ළඟා කරගැනීම්	16
මූල්‍යමය ක්‍රියාකාරීත්වය	18
පසුගිය වසර දහය තුළ වැදගත් මූල්‍ය විස්තර	32
විගණන වාර්තාව	33

ආයතනික සාරාංශය

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනත යටතේ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය ස්ථාපිත කර ඇත. එම පනත ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේ භාෂා අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම වන අතර ආයතනයට අනන්‍ය වූ ක්‍රමෝපායන් මගින් එම කාර්යය වඩාත් ප්‍රවර්ධනය කරනු ලබයි. ආයතනය මගින් රාජ්‍ය නිලධාරීන්ට, භාෂා පුහුණුකරුවන්ට, භාෂා හා භාෂණ පරිවර්තකයන්ට හා පොදු ප්‍රජාව උදෙසා විශේෂයෙන් සැලසුම් කරන ලද සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ විදේශ භාෂා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

දැක්ම

ජන සමාජය වෙත කාර්යක්ෂමව සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය අංශයේ හා අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල තුළ ද්විභාෂා, ත්‍රෛ භාෂා හැකියා වර්ධනය කරලීමේ ප්‍රමුඛ අධ්‍යාපන සහ පුහුණු ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස භාෂා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ත්‍රෛභාෂා දැනුම සම්පාදනය කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීම

හර වටිනාකම්

- අධ්‍යයන විශිෂ්ටතාව
- සංස්කෘතික අන්තර්කරණය
- නව්‍ය ඉගෙනුම
- උපායමාර්ගික සහයෝගිතාව
- ආචාරධර්මීය අවංකභාවය
- තිරසර වර්ධනය
- ශිෂ්‍ය සවිබල ගැන්වීම

ආයතනයේ අරමුණු

1. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් තැනැත්තෙක් සිටින්නේ නම් එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීම.

2. ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තක සේවයෙන් පත්කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහි කිරීම.

3. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහිකිරීම.

4. මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම.

කළමනාකරණ මණ්ඩලය

(2024.01.19 සිට 2024.08.13 දක්වා)

විනෝද් කුමාර් මුණසිංහ මහතා
සභාපති - (2023.11.14 සිට 2024.08.13 දක්වා)

චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මිය
සභාපති - (2024.11.12 සිට)

එම්.එල්. ගම්මම්පිල මහතා
අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය

ඩී.ඒ.පී. එස්. සමන් කුමාරි මහත්මිය
අතිරේක ලේකම් - ජාතික ඒකාබද්ධතා අංශය
අධිකරණ අමාත්‍යාංශය

ඩී.ඒ.පී. අබේසේකර මහතා
අධ්‍යක්ෂ ජනරාල් - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

සී.එම්.පී.ජේ. තිලකරත්න මහත්මිය
අධ්‍යක්ෂ - අධ්‍යාපන අමාත්‍යාංශය

මුරුගන් සචිතානන්දන් මහතා
කළමනාකරණ මණ්ඩල සාමාජික

හස්නා සේගු මහත්මිය
කළමනාකරණ මණ්ඩල සාමාජික

ජයන්ත ජයමාන්න මහතා
කළමනාකරණ මණ්ඩල සාමාජික

සීලරත්න සෙනරත් මහතා
කළමනාකරණ මණ්ඩල සාමාජික

ෂමින්ද මහලේකම් මහතා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) - මණ්ඩලයේ
ලේකම්
2023.11.06 සිට

අධ්‍යයන මණ්ඩලය

විනෝද් කුමාර් මුණසිංහ මහතා
සභාපති - (2023.11.14 සිට 2024.08.13 දක්වා)

චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මිය
සභාපති - (2024.11.12 සිට)

ආචාර්ය සඳගෝමි කෝපරහේවා මහතා
අංශ ප්‍රධානී - සිංහල භාෂා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල
අංශ ප්‍රධානී - සිංහල භාෂා හා ජන සන්නිවේදන අංශය, මානව හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආචාර්ය කේ. ඕ. ඩී. එස්. කරුණානායක මහතා
අංශ ප්‍රධානී - ඉංග්‍රීසි අංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආචාර්ය එම්.එස්.එෆ්. සාධියා මහත්මිය
අංශ ප්‍රධානී - භාෂා අංශය, ශාස්ත්‍ර සහ සංස්කෘතික පීඨය අග්නිදිග විශ්ව විද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආචාර්ය එස්. ප්‍රසාන්තන් මහතා
අංශ ප්‍රධානී - දෙමළ අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

ආචාර්ය පී.එන්.රත්නායක මහතා
අංශ ප්‍රධානී - ඉංග්‍රීසි සහ භාෂාමය අංශය මානව හා සමාජ විද්‍යා පීඨය රුහුණ විශ්වවිද්‍යාලය
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

පී. සේනාධීර මහතා
කොමසාරිස් ජනරාල් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
(2024.01.01 සිට 2024.12.31 දක්වා)

සභාපතිතුමියගේ

පණිවිඩය

චන්ද්‍රා වික්‍රමසිංහ
සභාපති
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

භාෂා පුහුණුව, හා අධ්‍යාපනය සම්බන්ධව ප්‍රමුඛ ජාතික ආයතනයක් බවට පත්වීම ආයතනික දැක්ම කොට ගත්, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, පවතින සීමිත මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගනිමින් ලාංකේය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා සංහිඳියාව පවත්වාගෙන යාම සඳහා මාහැඟි දායකත්වයක් සපයනු ලබයි.

හුදු චක්‍රලේඛගත භාෂා පුහුණුවකට ලඝු නොවී භාෂා භාවිත කරන ජන කොට්ඨාසවල සංස්කෘතිමය හා මානවීය ගුණාංග ස්පර්ශ කරමින් ජාතීන් අතර සංස්කෘතික අවබෝධය ඇති කිරීම උදෙසාත් එමගින් සැබෑ සහජීවන ආකල්ප සමාජගත කිරීම සඳහාත් අප අඛණ්ඩ ප්‍රයත්නයක නිරත වී සිටිමු.

එකී භාරදූර ගමනේදී ආයතනයක් වශයෙන් අප අපගේ මූල්‍යමය භෞතික ඉලක්ක සපුරා ගනිමින් අපගේ පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවයද ආරක්ෂා කර ගනිමින් ක්‍රියාත්මක වීමට පියවරගෙන ඇති බව සිහිපත් කරන්නේ සංතුෂ්ටියෙනි.

ඉදිරි අනාගතයේදී දිවයින පුරා අප ආයතනයේ වැඩසටහන් ව්‍යාප්ත කිරීමේ කාර්යභාරය ඉටුකිරීම සඳහා සියලුම පළාත් මට්ටමින් පුළුල් දැක්මක් අනුව ක්‍රියාකිරීම අපගේ අභිප්‍රාය වී තිබේ. ඒ අනුව අප ආයතනය මඟින් දියත් කරන මෙකී ජාතික කාර්යභාරය ඉදිරියේදී තවදුරටත් දීප ව්‍යාප්ත මට්ටමින් පුළුල් කිරීම සඳහා පළාත් සභා ආශ්‍රිත පුහුණු මධ්‍යස්ථාන සමඟ මනා සම්බන්ධීකරණයක් සිදු කරමින් මෙම ජාතික කාර්යභාරය ඉටු කිරීම සඳහා පෙළගැසෙමින් සිටිමු.

මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂිතා

මුළු අදායම

2024 වර්ෂය තුළදී රුපියල් මිලියන 285.181ක අදායමක් උත්පාදනය කිරීමට ආයතනයට හැකියාව ලැබිණ.



මුළු වියදම

2024 වර්ෂය තුළදී රුපියල් මිලියන 172.228ක වියදමක් ආයතනය විසින් දරා ඇත.



වත්කම් වැඩිවීම

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළදී ආයතනයේ ශුද්ධ වත්කම රුපියල් මිලියන 156.653කින් වැඩි වී ඇත.



ආදායම		ලාභය	
2023	2024	2023	2024
රු. 246,226,587	රු. 285,181,293	රු. 92,498,165	රු. 112,952,401
වැඩිවීම +	16%	වැඩිවීම +	22%

රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද දෙවන භාෂා පුහුණු වැඩසටහන්



අනෙකුත් පුහුණු වැඩසටහන්



පාඨමාලා ගණන		පාඨමාලාලාභීන් ගණන	
2023	2024	2023	2024
627	665	35,233	32,105
වැඩිවීම +	6%	අඩුවීම -	-9%

ආයතනික ව්‍යුහය

ප්‍රධාන කාර්යාලය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ ප්‍රධාන කාර්යාලය 321/1 හයිලෙවල් පාර, මාකුඹුර,පන්නිපිටිය යන ස්ථානයේ ක්‍රියාත්මක වේ. භාෂා පාඨමාලා සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සියලුම අමාත්‍යාංශ හා ආයතන සමග කාර්යක්ෂම සම්බන්ධතාවක් ඇති කර ගැනීම ප්‍රධාන කර්යාලය මගින් සිදුවේ. එසේම විවිධ පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුහුණු මධ්‍යස්ථානය කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත, ගලේවත්ත ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ඉඩම පිහිටි පරිසරය, භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩාත් සෞන්දර්යාත්මකව, ප්‍රායෝගිකව සහ බුද්ධිමය ආකාරයෙන් සිදු කළ හැකි පරිසරයක වන අතර මනස්කාන්ත භූදර්ශනයක නේවාසික පහසුකම් සහිතව අගලවත්ත භාෂා මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය තුළ නේවාසික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එක වර 60 දෙනෙකු සඳහා නවාතැන් ගැනීමේ පහසුකම් පවතී. දේශනා ශාලාවකින්, පුස්තකාලයකින් හා ආපන ශාලාවකින් මෙම මධ්‍යස්ථානය සමන්විත වේ.

• පරිපාලන අංශය

ආයතනයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු මෙම අංශය මගින් සිදු කරයි. ආයතනයේ අනෙකුත් අංශවල කාර්යයන් බාධාවකින් තොරව ඉටු කිරීමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින් අංශ අතර සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. තවද, අනෙකුත් අංශවලට අවශ්‍ය නව බඳවා ගැනීම් සිදු කරන අතරම විවිධ අංශ කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සේවක සුබසාධනය සහ සේවක අභිප්‍රේරණය ඉහළ නංවාලීමට මෙම අංශය මඟින් කටයුතු කරනු ලැබේ.

පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය මෙවලම්, සියලුම අංශ සඳහා අවශ්‍ය පරිගණක, කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය මෙම අංශය මඟින් මිලදී ගන්නා අතර වාහන නඩත්තු, ප්‍රවාහන පහසුකම්, ආරක්ෂක සේවා සහ පිරිසිදු කිරීමේ සේවා පවත්වාගෙන යාම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. එමෙන්ම පුස්තකාල හා ප්‍රලේඛන සේවාද මෙම අංශය මඟින් පවත්වා ගෙන යනු ලබයි.

• සැලසුම් අංශය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ සඳහන් ඉලක්ක අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීමක් වේ.
පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, සංයුක්ත සැලසුම් සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සහ මාසික සැලසුම් සකස් කිරීම, මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කර අදාළ අංශ වෙත යොමු කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

• ගිණුම් අංශය

ආයතනයේ සියලුම ගිණුම් සහ මූල්‍ය කටයුතු භාරව කටයුතු කිරීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ. ප්‍රධාන මූල්‍ය විධායකයා අධ්‍යක්ෂ ජනරාල් වන අතර ගණකාධිකාරි මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වගකියනු ලැබේ.

• අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය ස්වාධීන වන අතර එමගින් ආයතනයෙ මෙහෙයුම් සඳහා මගපෙන්වීමක් සිදු කරනු ලබයි. ආයතනයේ දත්ත විශ්ලේෂණය සහ ක්‍රියාවලිය මත පදනම්ව නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීමෙන් ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට සහය වන අවදානම් කළමනාකරණය , පාලන , වැඩිදියුණු කිරීම් සහ ඵලදායිතාව තුළින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය තුළ ක්‍රමානුකූල සහ විනයානුකූල ක්‍රමවේද භාවිත කරයි.

• පුහුණු අංශය

පුහුණු අංශයේ මූලික කාර්යභාරය වනුයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 01/2023 අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා කාණ්ඩ තුනක් යටතේ දෙවන භාෂා පුහුණු පාඨමාලා සංවිධානය කිරීමයි. ඒ යටතේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

1.මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැය 200 දෙවන බස (සිංහල/දෙමළ) පුහුණු පාඨමාලා පැවැත්වීම.

2.ද්විතීයික ශ්‍රේණියේ රාජ්‍ය නිළධාරීන් සඳහා පැය 150 දෙවන බස (සිංහල/දෙමළ) පුහුණු පාඨමාලා පැවැත්වීම.

3.ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැය 100 දෙවන බස (සිංහල/දෙමළ) පුහුණු පාඨමාලා පැවැත්වීම.

ඉහත සියලුම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මෙන්ම එම කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රමවේද යොදමින් පුහුණු පාඨමාලා සම්බන්ධ විධිමත් අධීක්ෂණයක් හා නියාමනයක් පවත්වා ගෙන යාමද මෙම අංශයේ කාර්යභාරයට අයත් වේ. එසේම සම්පත්දායක සංචිතය යාවත්කාලීන කර පවත්වා ගෙන යමින් එම සම්පත්දායකයන් නියමිත පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. එසේම ආයතනික අරමුණු වඩාත් ඵලදායී අයුරින් සාක්ෂාත් කර ගනු වස් පුහුණු අංශය සඳහා පහත සඳහන් කාර්යයන්ද පවරා ඇත.

1. රාජ්‍ය නිලධාරීන් සඳහා අර්ධකාලීන පාඨමාලා පවැත්වීම.

2. ගුරු පුහුණු පාඨමාලා පැවත්වීම.

3. පසු විපරම් හා නියාමන වැඩසටහන් සංවිධානය කිරිම.

4. සියලුම පූර්ණකාලීන පාඨමාලා සඳහා විධිමත් ඇගයීම් පවැත්වීම.

මීට අමතරව ආයතනය මඟින් පවත්වනු ලබන ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා දියත් කරනු ලබන්නේද පුහුණු අංශය මඟිනි. ඒ යටතේ,

1. දෙවන බස සිංහල හා දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව

2. දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත් හා ඩිප්ලෝමා පාඨමාලාව

3. භාෂා සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව

4. විවිධ වෘත්තිකයන් සඳහා වන දෙවන භාෂා පාඨමාලා

5. ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා

6. විදේශ භාෂා පුහුණු පාඨමාලා

7. සංඥා භාෂා සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා

8. බ්‍රේල් භාෂා පාඨමාලාව

මෙම පාඨමාලාවලට අදාළ සියලු කටයුතු පුහුණු අංශය මඟින් සිදු කරනු ලබන අතර කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පුහුණු පාඨමාලා යාවත්කාලීන කරමින් සංවිධානය කිරීම කෙරෙහිද පුහුණු අංශය නිරන්තරයෙන් අවධානය යොමු කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජය තුළ විවිධ භාෂා භාවිත කිරීමේ අයිතිය තහවුරු කිරීම අරමුණු කරගනිමින් භාෂා විවිධත්වයකින් යුතු ජාතීන් අතර සාමය සහ සහජීවනය වර්ධනය වන අයුරින් මෙම පාඨමාලා සංවිධානය කර ඇත. එහිදී සාම්ප්‍රදායික දෙවන භාෂා පාඨමාලා ඉගැන්වීමේ රටාවෙන් විතැන්ව හෘදයාගමව බැඳුණු සෞන්දර්යාත්මක ප්‍රවේශයක් ඔස්සේ ප්‍රායෝගික භාෂා භාවිතය හා සංහිඳියාත්මක ආකල්ප ප්‍රවර්ධනය කෙරෙන ගුණාත්මක තත්වයෙන් ඉහළ පාඨමාලා ලබාදීමට පුහුණු අංශය නිරන්තරයෙන් කටයුතු කරයි.

ආයතනික පාලනය

- ## කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු තීරණ ගනු ලබන්නේ 2007 අංක 26 දරන පනතේ 3(1) වගන්තියට අනුව ගරු විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පත් කරනු ලබන කළමනාකරණ මණ්ඩලය මගිනි. 2024 වසරට අදාළව කළමනාකරණ මණ්ඩල රැස්වීම් හතක් පවත්වා ඇත.

- ## අධ්‍යයන මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන කාර්යන්ට සහාය වීමට සහ ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පනතේ විධිවිධාන අනුව අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලබයි.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ විවිධ විශ්වවිද්‍යාලවල භාෂා සහ අධ්‍යාපන අංශ නියෝජනය කරන, විශ්වවිද්‍යාලවල ඉගෙනුම් ක්‍රියාවලිය මෙහෙයවන ආචාර්යවරුන් සහ මහාචාර්යවරුන්ගෙන් සමන්විත අධ්‍යයන මණ්ඩලය ආයතනයේ භාෂා අධ්‍යාපන හා පුහුණු සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සෘජුවම දායකත්වය ලබා දෙනු ලැබේ. පනතේ විධිවිධානයන්ට අනුව අධ්‍යයන මණ්ඩලය විසින් ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් ආයතනයට උපදෙස් දිය යුතු අතර අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ ලබාදෙනු ලැබේ.

- ## ආයතනයේ කළමනාකරණය

ආයතනික කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා අයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර කළමනාකරණ මණ්ඩලයේ විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් රාජකාරි ඉටු කරයි. ආයතනයේ පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණ පිළිබඳ වගකීම්, ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය පත් කිරීම, ආයතනය විසින් පත්වනු ලබන සියලු පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය, පරිපාලනය හා ආයතනික කටයුතු අධීක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලබයි.

ආයතන කාර්යමණ්ඩලය

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 41 ක් වන අතර , 2024 වර්ෂය අවසන් වන විට 37 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ නිරත වූහ. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා ද ආයතනය මගින් වැඩමුළු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

පිරිමි නිලධාරීන්



කාන්තා නිලධාරීන්



කාර්ය මණ්ඩල සංයුතිය



මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	සේවයේ නියුත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	12	10
තෘතීය	2	2
ද්විතීයීය	17	14
ප්‍රාථමික	10	11
එකතුව	41	37

භාෂාව, සංස්කෘතිය සහ සහජීවනය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2023 ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන්ට සිංහල / දෙමළ දෙවන භාෂා ප්‍රවීණතාවය ලබාදීම සඳහාත්, සාමාන්‍ය ප්‍රජාව සඳහා දෙවන භාෂා කුසලතාව ලබාදීම සඳහාත් අප ආයතනය මගින් භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලබයි.

එහිදී හුදු භාෂා ඉගැන්වීමෙන් පමණක් නොනැවතී එම භාෂාව භාවිතා කරන ජන වර්ග සතුව පවතින සංවේදී සංස්කෘතික සාධක පිළිබඳවත් සැලකිල්ලට ගෙන භාෂාව හා සංස්කෘතික අවබෝධය යන කාරණා ද්විත්වයම කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ පුහුණු පාඨමාලා සංවිධානය කර ඇත.

විශේෂයෙන්ම දෙවන භාෂා පුහුණු පාඨමාලාවල විෂය නිර්දේශයට ක්ෂේත්‍ර අධ්‍යනයක් ඇතුළත් කිරීම මඟින් පුහුණුව ලබන භාෂා මාධ්‍යයට අදාළ ජන වර්ගය වෙසෙන ප්‍රදේශයක් කරා ගොස් අදාළ භාෂා මාධ්‍යයෙන් කතාබහ කොට ඔවුන්ගේ ආගමික චාරිත්‍ර, ආහාර රටා, ඇඳුම් හා විශ්වාස වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳ නිවැරදි ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

එමෙන්ම පාඨමාලා අවසානයේ පවත්වනු ලබන සංස්කෘතික ප්‍රසංගය මඟින් ද මෙකී සංස්කෘතික සංස්පර්ශය ගැඹුරින් සිදු කරනු ලබයි. එහිදී සමස් වැඩසටහනම ඉගෙනගත් භාෂා මාධ්‍යයෙන් සිදු කිරීමත් අදාළ සංස්කෘතිය වැළඳ ගනිමින් එම ඇඳුම් පැළඳුම්, චාරිත්‍ර වාරිත්‍ර, සැරසිලිවලට අනුගත වෙමින් සංස්කෘතිය හා බැඳි කලා අංග එළි දැක්වීමක් සිදුවෙන අතර එහිදී කථනය මූලික කොටගත් කලා අංග ඉදිරිපත් කිරීම සඳහා පාඨමාලාලාභීන් දිරිගන්වනු ලබයි.

තවද වෛද්‍යවරුන්ගේ පාඨමාලා අතරතුර පවත්වනු ලබන වෛද්‍ය කඳවුරු මඟින්ද තමා ලබාගත් භාෂා පුහුණුව ප්‍රායෝගිකව ක්ෂේත්‍රය තුළ භාවිත කිරීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් ලබා දීමටද කටයුතු කරනු ලබයි.

ඒ අනුව වර්ධනය කරගත් භාෂා කුසලතාව මඟින් හා ලබාගත් සංස්කෘතික අවබෝධය ඇසුරින් සහෝදර ජන ප්‍රජාවන් කෙරෙහි සංවේදී වෙමින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීමත් සමාජය තුළ සංහිඳියාව හා සහජීවනය පිළිබඳ සාධනීය ආකල්ප ප්‍රවර්ධනය කිරීමත් යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ පාඨමාලා සැකැස්ම මා හැඟි පිටුබලයක් සපයනු ලබන බව අපගේ විශ්වාසයයි.

OPPO F19

ඩිජිටල්කරණය

වෙබ් අඩවිය නිර්මාණය කිරීම

ආයතනයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක නොවන තත්ත්වයක තිබූ අතර 2024 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව නව වෙබ් අඩවියක් ස්ථාපිත කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ තුළින් නවීන තාක්ෂණයට අනුවත් තරඟකාරීත්වයට ගැළපෙන පරිදිත් උසස් තත්ත්වයේ වෙබ් අඩවියක් පවත්වාගෙන යාමට අපේක්ෂා කරන ලද අතර අවශ්‍ය පාර්ශව වෙත ආයතනයේ තොරතුරු ඉතා පහසුවෙන් සහ කඩිනමින් ලබාගැනීමට එමඟින් අවස්ථාව හිමිවනු ඇත.

සහතික පත්‍ර සත්‍යාපන පද්ධතිය ස්ථාපිත කිරීම

18/2020 චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් සඳහා දෙවන බස (සිංහල / දෙමළ) භාෂා පුහුණු පාඨමාලා ඇතුලුව අනෙකුත් භාෂා පුහුණු පාඨමාලා ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. වර්ෂයකට සහතික පත්‍ර 30,000 කට අධික ප්‍රමාණයක් ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර එම සහතික පත්‍ර සත්‍යාපනය සඳහා ආයතනය වෙත ලිපි යොමු කරනු ලබයි. එම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා මෙම පද්ධතිය ආයතනය මඟින් හඳුන්වා දුන් අතර එමඟින් වෙබ් අඩවිය හරහා සහතික පත්‍ර සත්‍යාපනය කරගැනීමේ අවස්ථාව ලබා දී ඇත. ඒහරහාපාඨමාලාලාභීන්ගේ මෙන්ම ආයතනයේ කාර්යමණ්ඩලයේද කාලය ශ්‍රමය හා මුදල් ඉතිරි කරගැනීමට හැකියාව ලැබී ඇත.

2024 වර්ෂයේ ඉලක්ක ළඟා කරගැනීම්

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2023 අනුව පවත්වනු ලබන දෙවන බස සිංහල/දෙමළ පුහුණු පාඨමාලා

රාජ්‍ය නිලධාරීන් 29,212 කු සඳහා සිංහල/දෙමළ භාෂා පුහුණු පාඨමාලා 649 ක් ක්‍රියාත්මක කිරීම තුළින් දෙවන භාෂා ප්‍රවීණතාවය ලබාදීමට හැකිවීම.

වැඩසටහන	ඉලක්කය			ප්‍රගතිය		
	වැඩසටහන් ගණන	පාඨමාලාලාභීන් ගණන	ආදායම (රු.මි)	වැඩසටහන් ගණන	පාඨමාලාලාභීන් ගණන	ආදායම (රු.මි)
පැය 100 සිංහල/දෙමළ භාෂා පුහුණු පාඨමාලා	52	1,797	8.23	80	2,936	13.895
පැය 150 සිංහල/දෙමළ භාෂා පුහුණු පාඨමාලා	316	15,147	127.90	474	22,520	194.110
පැය 200 සිංහල/දෙමළ භාෂා පුහුණු පාඨමාලා	78	3,205	46.68	95	3,756	53.070
එකතුව	**446**	**20,149**	**182.81**	**649**	**29,212**	**261.075**

** 2024 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින සියලුම පාඨමාලා ඇතුළත්ව ඇත.

- අනෙකුත් පුහුණු පාඨමාලා

අනු අංකය	පාඨමාලාව	ඉලක්කය			ප්‍රගතිය (සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින)		
		වැඩසටහන් ගණන	පාඨමාලාලාභීන් ගණන	ආදායම (රු. මි.)	වැඩසටහන් ගණන	පාඨමාලාලාභීන් ගණන	ආදායම (රු.මි.)
01	පැය 50 මූලික ගුරු පුහුණු පාඨමාලා	02	80	1.60	01	29	0.58
02	සිංහල භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	01	35	1.69	01	48	1.69
03	දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	01	45	1.51	01	31	0.61
04	ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව	01	49	0.73	01	49	0.74
05	ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව	01	15	0.21	01	15	0.22

06	කොරියන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව	01	15	0.21	01	12	0.21
07	භාෂා සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව	03	75	1.81	02	52	.61
08	සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	01	30	1.45	01	20	.97
09	සම්පත් දායකයන් සඳහා වන ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	02	100	-	02	91	-
10	පසු විපරම් සහ නියාමන වැඩසටහන්	05	370	-	04	270	-
11	තරුණ තරුණියන් සඳහා භාෂා කඳවුරු	01	200	-	01	200	-
	එකතුව	**19**	**1,014**	**9.21**	**16**	**817**	**5.63**

- **ඉටු කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්**

1. සහතික පත්‍ර සනාථ කිරීම සඳහා අන්තර්ජාල යෙදවුමක් (Web Directory) නිර්මාණය කිරීම.
2. රුහුණු විශ්ව විද්‍යාලය හා එක්ව අන්තර් ජාතික මව් භාෂා දිනය සැමරීම.
3. ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවලට අදාළ විෂය මාලා පිළියෙල කිරීම.
4. වෛද්‍ය නිලධාරීන්ගේ පුහුණු පාඨමාලාවලට අදාළ පාඨමාලා විෂය නිර්දේශ පිළියෙල කිරීම.
5. ප්‍රායෝගික සිංහල/ දෙමළ පුහුණු පාඨමාලාවලට අදාළ විෂය මාලා පිළියෙල කිරීම.
6. ත්‍රීරෝද රථ සහ කුලී රථ රියදුරන් සඳහා වන පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට අදාළව මූලික කටයුතු සිදු කිරීම.
7. රාජ්‍ය භාෂා දිනය නිමිති කොට ගනිමින් “ද්විභාෂා තරු” සමූහ ගායනා තරඟාවලිය පැවැත්වීම.

විස්තරය	වටිනාකම රු.	මුළු වටිනාකම රු.
ආදායම්		
පුහුණු වැඩසටහන්වලින් ලද ආදායම	260,029,265	
ආයෝජන ආදායම (පොළී)	20,649,028	
වෙනත් ආදායම්	4,503,000	
මුළු ආදායම		**285,181,293**
වියදම්		
පරිපාලන වියදම්	76,515,869	
පුහුණු වැඩසටහන් සඳහා වියදම්	95,157,152	
මූල්‍ය වියදම්	555,871	
මුළු වියදම		**(172,228,892)**
ලාභය/අලාභය		**112,952,401**

මූල්‍යමය ක්‍රියාකාරීත්වය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනකාරී සාධක සඳහා කිසිඳු ගැළපීමක් සිදු කර නොමැත. අවශ්‍ය අවස්ථාවලදී, භාවිත කර ඇති නිශ්චිත ප්‍රතිපත්ති පසුව දක්වා ඇති සටහන්වල පැහැදිලි කර ඇත.

1.2 සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා පෙර කාල පරිච්ඡේදයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක අගයන් හෙළිදරව් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල අයිතමවල ඉදිරිපත් කිරීම හෝ නැවත වර්ගීකරණය සංශෝධනය කර ඇති විට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම සඳහා වත්මන් වර්ෂය සමග අනුකූල වීමට සංසන්දනාත්මක ප්‍රමාණයන්ද නැවත වර්ගීකරණය කර ඇත.

1.3 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩුකර දක්වා ඇත. නිදහස් ඉඩම් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල මාග ක්‍රමයට ක්ෂය කිරීම සඳහා ක්ෂය වීමේ ප්‍රතිපාදනය ගණනය කරනු ලැබේ.

1.3.1 ක්ෂයවීම

දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය වීම ගණනය කරනු ලබන්නේ මිලදී ගත් දිනය/ බැහැර කළ දිනය මත පදනම්ව සරල මාර්ග ක්‍රමය යටතේ ය

- දේපළ, පිරියත සහ උපකරණ

අයිතමය	අනුපාතය %
ගොඩනැගිල්ල සහ ව්‍යුහය	2.5
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	10
පුස්තකාල පොත්	10
පිරියත යන්ත්‍රෝපකරණ සහ උපාංග	20
වාහන	25
පරිගණක	25
වෙබ් අඩවිය සහ මෘදුකාංග	25

1.4 පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවකයෙකු බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම නිලධාරීන් සඳහා පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබා ගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂිත මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයෙකු සේවයෙන් ඉවත්වීමේදීය.

1.5 ලැබිය යුතු ශේෂ

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්දි වටිනාකම මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණයගැති ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම කරනු ලබයි.

1.6 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැන්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරනු ලබයි.

1.7 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

1.8 බැරකම් වෙන් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කර දින වන විට නිශ්චිතව ගනණය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදුකර ඇත.

1.9 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන්කිරීම

සේවකදායකයින්හට සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12%ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලබයි.

1.10 ආදායම

පුනරාවර්තන වියදම් සඳහා මහ භාණ්ඩාගාරය මඟින් පුනරාවර්තන වියදම් වෙනුවන් ලැබෙන ප්‍රධාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, මූල්‍ය සාධක ප්‍රකාශනයේ පෙන්නුම් කරයි.

1.10.1 ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාර මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබාදෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

1.10.2 පුහුණු පාඨමාලා ආදායම්

සියලුම පුහුණු පාඨමාලා සඳහා වන ආදායම් යන ශේෂය යටතේද ආයතනයට ලැබෙන අනෙකුත් ආදායම්, අනෙකුත් ආදායම් යන ශේෂය යටතේද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත.

1.11 වියදම්

ආයතනයේ දෛනික කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්තන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

1.12 තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපිද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරයි.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම

2.1 ක්ෂයවීම් ප්‍රතිපත්ති

ක්ෂයවීම් ක්‍රමය මිලදී ගත් වර්ෂයේ සම්පූර්ණ වසර සඳහා ක්ෂය වීමේ සිට වෙනස් කර ඇති අතර 2014 වර්ෂයේ සිට මිලදී ගත් වත්කම් සඳහා මිලදී ගැනීමේ/ඉවත දැමීමේ වර්ෂයේ දින පදනම් ක්ෂය වීම්, දක්වා බැහැර කළ වර්ෂයේ ක්ෂය කිරීමක් සිදු නොකරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වක්‍ර ක්‍රමය, භාවිත කර සකස් කර ඇත. ආයතනයේ බැංකු සහ මුදල් ශේෂයෙන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළදී මුදල් සහ මුදල් සමාන වේ.

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

විස්තරය	සටහන්	2024.12.31 රු.	2023.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	06	58,446,154	50,649,490
ජංගම වත්කම්			
විකුණුම් සහ අනෙකුත් ලැබිය යුතු	07	53,201,617	33,308,669
තොගය - ලිපි ද්‍රව්‍යය සහ පරිභෝජන ද්‍රව්‍යය		2,344,813	1,334,029
මුදල් සහ මුදල් සමාන දෑ	08	363,042,652	235,089,571
මුළු වත්කම්		**477,035,236**	**320,381,759**
ශුද්ධ වත්කම්/ස්කන්ධ			
ප්‍රාග්ධනය		13,015,468	13,015,468
සමුච්චිත අතිරික්තය/(අලාභය)		300,658,091	187,705,689
ප්‍රත්‍යාගණන සංචිත		89,062,528	74,188,699
		402,736,087	**274,909,856**
ජංගම නොවන වගකීම්	09		
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම		7,537,035	7,227,180
ස්ථාවර වත්කම් සඳහා රජයේ ප්‍රතිපාදන		-	-
		7,537,035	**7,227,180**
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	10	64,256,133	36,940,137
උපචිත වියදම්	11	2,505,981	1,304,586
		66,762,115	38,244,723
මුළු ප්‍රාග්ධනය සහ වගකීම්		**477,035,236**	**320,381,759**

මූල්‍ය ප්‍රකාශන සහතික කිරීම සහ අනුමත කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි. 2024 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්තවයක් සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි අතිරික්තය /ඌනතාවය පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශනයක් කරන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීතිරීති හා රෙගුලාසි සමඟ අනුකූලවේ.

අනෝමා රූපසිංහ — ෂමින්ද මහලේකම්

ගණකාධිකාරි — අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

පිටු අංක 1 සිට 3 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 8 සිට 13 දක්වා පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති — අධ්‍යක්ෂ

දිනය — දිනය

2024.12.31 දිනට අවසන් වූ කාල සීමාව සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

විස්තරය	සටහන්	2024 රු.	2023 රු.
ආදායම්			
භාණ්ඩාගාර දීමනා ලැබීම්	01	-	50,203,000
පුහුණු වැඩසටහනේ ආදායම්		260,029,265	173,838,925
වෙනත් ආදායම්	02	25,152,028	22,184,662
මුළු ආදායම්		**285,181,293**	**246,226,587**
වියදම්			
පරිපාලන වියදම්	03	(76,515,869)	(82,310,560)
පුහුණු වැඩසටහන සඳහා වියදම්	04	(95,157,152)	(70,017,663)
මෙහෙයුම් ලාභය/(අලාභය)		113,508,272	93,898,364
මූල්‍ය වියදම්	05	(555,871)	(1,400,199)
බදු පෙර ලාභය/(අලාභය)		112,952,401	92,498,165
බදු		-	-
වසර සඳහා ලාභය/(අලාභය)		**112,952,401**	**92,498,165**

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

විස්තරය	දායක ප්‍රාග්ධනය රු.	සමුච්චිත ලාභය / (අලාභය) රු.	රදවාගත් සංචිත රු.	එකතුව
2024 ජනවාරි 01 දිනට ශේෂය	**13,015,468**	**180,244,695**	**74,215,823**	**267,475,986**
පෙර වසර සඳහා ගැලපීම් (සටහන12)	-	(380,727)	(27,124)	-
2024 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	-	-	-	-
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,051,468**	**179,863,968**	**74,215,823**	**147,762,890**
පෙර වසර ගැලපීම් (සටහන 12)	-	7,841,721	(27,124)	7,814,597
2024 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	-	112,952,401	14,873,829	127,826,231
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,051,468**	**300,658,091**	**89,062,528**	**283,403,717**

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2024 රු.	2023 රු.
අතිරික්තය / (හිඟය) බදු ගෙවීමට පෙර	112,952,401	92,498,166
මුදල් නොවන වෙනස්වීම් ගැලපීම්		
ක්ෂය වීම	10,568,188	10,127,840
පෙර වසර ගැලපීම්	-	-
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය වෙන්කිරීම	874,287	883,953
	124,394,876	**103,509,959**
අඩුකළා: පොලී ආදායම	(20,649,028)	(21,760,747)
ගෙවා ඇති පාරිතෝෂිත දීමනා	(564,433)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	**103,181,415**	**81,749,212**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ආදායම් වැඩිවීම/අඩුවීම	(19,892,948)	349,938
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වියදම් වැඩිවීම/අඩුවීම	28,517,392	8,366,701
තොග වෙනස්වීම් වැඩිවීම/අඩුවීම	(1,010,784)	995,114
	110,795,075	91,460,965
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**110,795,075**	**91,460,965**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(3,491,022)	(94,189)
දේපළ, පිරියත සහ උපකරණ වැඩවල ප්‍රගතියේ හි වෙනස්වීම්	-	-
පොලී ආදායම	20,649,028	21,760,747
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	17,158,006	21,666,558
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් මිලදී ගැනීමට භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	-	-
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස්වීම්	127,953,081	113,127,523
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	235,089,571	129,762,038
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන අ)	363,042,652	242,889,561
(සටහන අ) මුදල් සහ මුදල් සමාන දෑ		
බැංකුවේ පවතින මුදල්	**363,042,652**	**242,889,561**

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 01- ආදායම

විස්තරය	2024 රු.	2023 රු.
පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන	-	50,203,000
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන	-	-
භාණ්ඩාගාරයෙන් සම්පූර්ණ ප්‍රාගධන ප්‍රදානයන්	-	-
අඩු කිරීම : ස්ථාවර වත්කම් සඳහා ප්‍රදානයන්	-	-
පුහුණු වැඩසටහන් ආදායම	**260,029,265**	**173,838,925**

සටහන 02-වෙනත් ආදායම්

විස්තරය	2024 රු.	2023 රු.
ටෙන්ඩර් ගාස්තු	10,000	15,000
පොලී ආදායම	20,649,028	21,760,747
ඉදිරියට කළ පාඨමාලා ගාස්තු	5,000	-
ස්ථාවර වත්කම් සඳහා රජයේ ප්‍රදානයන්	-	-
ශාලා සහ නවාතැන් ගාස්තු	241,900	25,000
ලියාපදිංචි ගාස්තු	108,500	-
වෙනත් ආදායම්	4,137,600	383,915
මුළු එකතුව	**25,152,028**	**22,184,662**

සටහන 03- පරිපාලන වියදම්

විස්තරය	2024 රු.	2023 රු.
වැටුප් හා වේතන		
වැටුප් සහ දීමනා	23,172,118	21,600,515
EPF ආයතනික සහභාගිත්වය 12%	2,634,513	2,544,781
ETF ආයතනික සහභාගිත්වය 3%	658,628	636,195
සභාපති සඳහා දීමනා	795,891	864,975
අතිකාල ගෙවීම්	-	167,239
නිවාඩු දින දීමනා	454,512	34,080
වෙනත් දීමනා	2,453,174	2,831,790
වාහන සඳහා දීමනා	215,000	1,350,000
ඉන්ධන දීමනා	798,449	1,395,752
පුහුණුවන්නන් සඳහා දීමනා	3,231,640	1,234,612
කාර්ය මණ්ඩල පුහුණුව සහ ධාරිතාව සංවර්ධනය සඳහා	973,912	605,216
රැස්වීම් සඳහා සහභාගිත්ව දීමනා	484,239	326,910
ප්‍රසාද දීමනා සහ දිරි දීමනා	-	1,050,000
පාරිතෝෂික වියදම්	874,287	883,953
සංචාර - දේශීය	121,000	667,415
සංචාර - විදේශ	-	668,468

ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	-	824,559
ඉන්ධන	227,480	2,296,023
නිල ඇඳුම්	44,000	278,416
සංග්‍රහ වියදම්	22,633	230,334
පුවත්පත් සහ වෙනත්	4,540	331,781
මුද්දර ගාස්තු	19,075	-
නඩත්තු වියදම්		
වාහන	339,705	5,133,258
පිරියත සහ යන්ත්‍රෝපකරණ	1,402,711	1,214,342
පරිගණක	329,725	263,628
ගොඩනැගිල්ල	771,920	340,435
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	-	37,870
සේවා		
තැපැල් සහ සන්නිවේදන	-	732,862
විදුලිය	3,370,056	2,425,265
ජලය	530,365	237,387
කුලී වියදම්	10,471,790	10,411,417
ගමන් සහ ප්‍රවාහනය	-	-
ආරක්ෂක සේවය	4,890,828	3,990,243
සනීපාරක්ෂක සේවා සහ සහායක කාර්ය මණ්ඩල පිරිවැය	5,188,180	5,495,550
වෙළඳ ප්‍රචාරන	1,017,308	191,843
සනීපාරක්ෂක වියදම්	-	-
මෙහෙයුම් බදු කුලී	-	-
විගණන ගාස්තු	450,000	504,660
පරිවර්තන ගාස්තු	-	15,263
නීති ගාස්තු	-	7,000
කාර්යක්ෂමතා කඩයිම් විභාග ගාස්තු	-	17,100
වෙනත්	-	341,582
ක්ෂය වීම		
ගොඩනැගිලි හා ව්‍යුහයන්	658,406	648,569
පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ	5,882	43,622
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	2,150,736	1,979,476
වාහන	7,275,000	7,275,000
පුස්තකාල පොත්	-	-
පරිගණක	311,078	64,924
වෙබ් අඩවිය	167,088	116,250
මුළු එකතුව	**76,515,869**	**,82,310560**

සටහන 04 පුහුණු වැඩසටහන් සඳහා වියදම්

විස්තරය	2024 රු.	2023 රු.
සම්පත්දායකයින් සඳහා දීමනා	64,927,913	40,642,054
ලිපි ද්‍රව්‍ය සහ වැඩසටහන් අවශ්‍යතා	1,682,923	2,887,508
තැපැල් සහ සන්නිවේදන	3,457,704	2,380,960
ආහාර සහ සංග්‍රහ	4,952,602	6,803,893
නවාතැන් පහසුකම්	921,700	1,371,562
වාහන කුලිය	-	182,400
සහතික සහ ඩොකට් සඳහා මුද්‍රණ ගාස්තු	705,153	1,069,845
සහායක නිලධාරීන්ගේ සේවය	-	-
අතිකාල ගෙවීම්	4,411,128	2,898,606
නිවාඩු දින දීමනා	-	329,006
ඉන්ධන	6,688,160	6,145,166
විදුලිය	-	1,069,310
ජලය	-	179,339
සංචාරය - දේශීය	1,603,337	1,557,721
වාහන නඩත්තුව	4,890,576	-
නේවාසිකාගාර සහ කාර්යාල අවශ්‍යතා	-	92,325
පරිවර්තන, විභාග සහ උපදේශන ගාස්තු	221,111	18,873
බොල්ණය	-	2,290,285
වෙනත් සේවා	694,846	98,812
මුළු එකතුව	**95,157,152**	**70,017,663**

සටහන 05 මූල්‍ය වියදම්

විස්තරය	2024 රු.	2023 රු.
බැංකු ගාස්තු	25,321	22,100
පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු	530,550	1,378,099
මුළු එකතුව	**555,871**	**1,400,199**

සටහන 06 දේපළ පිරියත උපකරණ

විස්තරය	ක්ෂයවීම් අනුපාතිකය	2024-01-01 දිනට මුළු පිරිවැය (රු.)	වර්ෂය තුළ එකතු කිරීම (රු.)	කාලසීමාව තුළ ඉවත් කිරීම (රු.)	2024-12-31 දිනට මුළු පිරිවැය (රු.)	2024-01-01 දිනට සමුච්චිත ක්ෂය (රු.)	කාලසීමාව තුළ ඉවත් කිරීම (රු.)	වර්ෂය සඳහා ක්ෂය (රු.)	2024.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)	2024.12.31 දිනට ශුද්ධ අගය	2024.12.31 දිනට ප්‍රත්‍යාගණනය (රු.)	2024-12-31 දිනට වත්කම් වටිනාකම(රු.)
ඉඩම්		615,000	-		**615,000**	-		-	**-**	615,000		**615,000**
ගොඩනැගිලි හා ව්‍යුහයන්	0.025	25,942,745	393,475	(36,250)	**26,299,970**	4,277,166	(36,250)	658,406	**4,899,322**	21,400,649	-	**21,400,649**
පිරියත සහ උපකරණ	0.2	13,491,456	-	(136,340)	**13,355,116**	13,473,826	(136,340)	5,882	**13,343,368**	11,748	11,132,212	**11,143,960**
කාර්යාල උපකරණ	0.1	19,857,470	1,649,888	(195,275)	**21,312,083**	15,676,932	(195,275)	2,150,736	**17,632,393**	3,679,690	-	**3,679,690**
වාහන	0.25	29,100,000	-	-	**29,100,000**	5,142,329	-	7,275,000	**12,417,329**	16,682,671	-	**16,682,671**
පුස්තකාල පොත්	0.1	1,343,352	-	-	**1,343,352**	1,343,352	-	-	**1,343,352**	-	-	**-**
පරිගණක	0.25	8,316,944	1,244,310	(467,920)	**9,093,334**	8,316,944	(467,920)	311,078	**8,160,102**	933,233	3,741,617	**4,674,850**
NILET වෙබ් අඩවිය	0.25	465,000	203,350	-	**668,350**	251,928	-	167,088	**419,016**	249,334	-	**249,334**
එකතුව		**99,131,966**	**3,491,022**	**(835,785)**	**101,787,204**	**48,482,476**	**(835,785)**	**10,568,188**	**58,214,880**	**43,572,324**	**14,873,829**	**58,446,154**

**ඉහත සඳහන් වත්කම් මිලදීගත් පිරිවැයට2024 වර්ෂය සඳහා සම්පූර්ණ වශයෙන් ක්ෂය කර අවසන්ව ඇතත් භාවිතයේ පවතී. එම වත්කම් 2024.12.31 දිනට නැවත ප්‍රත්‍යාගණනය කර ඇත.

වත්කම්	වත්කම් වටිනාකම	සමුච්චිත ක්ෂය	ප්‍රත්‍යාගණනය
දේපළ පිරියත සහ උපකරණ	13,355,116	13,343,368	11,143,960
පරිගණක	9,093,334	8,160,102	4,674,850
පුස්තකාල පොත්	1,343,352	1,343,352	

සටහන 07 - වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

විස්තරය	2024 රු.	2023 රු.
ලැබිය යුතු ආදායම් - එච්.පී.ආර් හේවාසිංහ මහතා	58,983	58,983
ලැබිය යුතු ආදායම් - ස්ථාවර තැන්පතු පොලී	17,967,134	11,457,936
උත්සව අත්තිකාරම්	114,000	449,000
තැන්පතු - ලැබිය යුතු	351,500	351,500
ගොඩනැගිලි සඳහා ගෙවන ලද අත්තිකාරම	6,400,000	6,250,000
ලැබිය යුතු වැඩසටහන් ආදායම්	10,879,500	1,311,000
වරලත් ආයතනයන්ගෙන් ලැබිය යුතු මුදල්	16,360,500	13,430,250
ලැබිය යුතු - එස්.ලලිතසිලි මහත්මිය	1,070,000	-
එකතුව	**53,201,617**	**33,308,669**

සටහන 08 - මුදල් හා මුදල් සමාන දෑ

විස්තරය	2024 රු.	2023 රු.
ලංකා බැංකු - ජංගම ගිණුම 00077442918		
ප්‍රාග්ධන මුදල් පොත	17,223	17,223
පුනරාවර්තන මුදල් පොත	5,130	4,954,859
ආදායම් මුදල් පොත	1,092,726	49,275,975
ඉතිරි කිරීමේ ගිණුම- ලංකා බැංකුව 79712746	434,393	424,180
ස්ථාවර තැන්පතු	281,493,181	180,397,334
ප්‍රතිමිලදී ගැනීම් ආයෝජන (Repo Investment)	80,000,000	-
අත්තිකාරම් - ආදායම්	-	20,000
එකතුව	**363,042,652**	**235,089,571**

සටහන 09 - ජංගම නොවන වගකීම්

විස්තරය	2024 රු.	2023 රු.
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	7,537,035	7,227,180
එකතුව	**7,537,035**	**7,227,180**

සටහන 10 - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

විස්තරය	2024 රු.	2023 රු.
ආපසු ගෙවිය යුතු තැන්පතු	550,000	565,000
සම්පත් දායක දීමනා	37,966,983	22,910,058
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය	-	5,050
සනිපාරක්ෂක සේවා	-	543,825
ආරක්ෂක සේවා	-	318,377
ඉදිරියට ලද පාඨමාලා ගාස්තු	20,972,500	105,000
විගණන ගාස්තු	882,000	432,000
පෙළපොත් හා ගුරුමාර්ගෝපදේශ සැකසීම	423,000	423,300
කුලී	122,401	8,488,533
පාඨමාලා ගාස්තු	7,000	58,500
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	45,430	-
ණයහිමියන් - විකාශන හා රූපවාහිනී වැඩසටහන්	2,959,496	2,959,496
රඳවා ගැනීමේ බදු (WHT)	327,323	27,568
වෙනත් උපචිත වියදම්	-	103,730
එකතුව	**64,256,133**	**36,940,137**

සටහන11- උපචිත වියදම්

විස්තරය	2024 රු.	2023 රු.
ගමන් වියදම් - දේශීය	105,220	7,990
තැපැල් සහ සන්නිවේදන	92,913	97,804
විදුලි ගාස්තු	283,483	303,419
ජල ගාස්තු	50,978	57,178
ඉන්ධන	443,651	290,602
ආහාර හා සංග්‍රහ	-	20,460
ආරක්ෂක සේවා	400,562	-
අතිකාල දීමනා	563,712	469,868
නිවාඩු දින ගෙවීම්	26,999	8,687
වැටුප් හා පුහුණුලාභී දීමනා	42,000	-
රැස්වීම් සහභාගීත්ව දීමනා	15,980	-
පවිත්‍රතා සේවා	451,200	-
වාහන කුලී	-	24,450
නවාතැන් පහසුකම්	-	9,000
පරිගණක නඩත්තුව	-	3,800
වාහන නඩත්තු	7,580	-
මුද්දර ගාස්තු	11,376	8,325
සුභසාධනය	5,800	-
පුද්ගල ආදායම් බදු (APIT)	4,528	3,003
එකතුව	**2,505,981**	**1,304,586**

සටහන 12 පෙර වසරේ ගැලපීම්

විස්තරය	2024 රු.	2023 රු.
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී	-	11,457,936
ලැබිය යුතු වැඩසටහන් ආදායම	-	860,000
කාර්යාලීය උපකරණ, වාහන සඳහා වන සමුච්චිත ක්ෂය	-	(679,594)
ස්ථාවර වත්කම් සඳහා රජයේ ප්‍රදානයන් - 2023	-	(636,332)
උපචිත ගොඩනැගිලි කුලිය	-	206,873
කලින් ලද ආදායම	-	(1,240,000)
සමුච්චිත අතිරික්තය	-	7,433,870
උපචිත සම්පත් දායක දීමනා	-	165,600
ස්ථාවර තැන්පතු ගිණුම්	-	(7,799,990)
ගෙවිය යුතු නවාතැන් පහසුකම්	(25,000)	-
ගෙවිය යුතු පරිගණක නඩත්තු	(127,900)	-
ගෙවිය යුතු ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	(610,984)	-
එකතුව	**(763,884)**	**9,768,363**

සටහන 13- ආයතනයට එරෙහිව ගොනු කර ඇති නඩු

1- ආයතනයේ සේවයෙන් පහ කරන ලද පී.එම්.එම්. ෆිර්තවුස් මහතා, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයට එරෙහිව හෝමාගම කම්කරු උසාවියේ 33/1415/2019 අංක යටතේ නඩුවක් ගොනු කර ඇති අතර, නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා සිටින අතර නඩුව දැනට විභාග වෙමින් පවතී.

2- ආයතනයේ සේවයෙන් පහ කරන ලද සී.සී. සිල්වා මහතා, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයට එරෙහිව හෝමාගම කම්කරු උසාවියේ 33/1560/2021 අංක යටතේ නඩුවක් ගොනු කර ඇති අතර, නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා සිටින අතර නඩුව දැනට විභාග වෙමින් පවතී.

3- ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරිනියක ලෙස සේවය කරන පී.පස්මිලා රවිරාජ් මහත්මිය, ආයතනයේ අධ්‍යක්ෂ තනතුර නොලැබීම සම්බන්දයෙන් ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයට එරෙහිව අභියාචනාධිකරණයේ CA/WRIT/2018/ 2019 අංක යටතේ නඩුවක් පවරා තිබුණි.

එන්. ඩබ්. ඩබ්. ආර්. පී. වික්‍රමසිංහ මහතාට ඉහත තනතුර සඳහා සුදුසුකම් නොමැති බව එහිදී තීන්දුව ලබා දී ඇත.

5- 2019 වර්ශයේ භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පහසුකම් සැලසූ වරලත් නියෝජිත ආයතනයක් ලෙස ලියාපදිංචි වූ නිෂා තමිල් ඇකඩමිය, ඔවුන්ට හිමි රුපියල් 446,485 ක මුදලක් නොලැබීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමේ HRC/ AP/T2/2021 අංක යටතේ ආයතනයට එරෙහිව පැමිණිල්ලක් ගොනු කර ඇත.

6- 2023/12/13 දින එච්.ජී.ආර්.හේවාසිංහ මහතා අභියාචනාධිකරණයේ අංක CA/Writ/0368/23 යටතේ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට විරුද්ධව නඩු පවරා ඇත.

සටහන 14- 2019 අයවැය යෝජනාවට අනුව භාෂා පුහුණුකරුවන් පුහුණුකිරීම

2019 අයවැය යෝජනාව හා අමප/19/2693/131/018-I අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ "භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන" ආරම්භ කර ඇති අතර, එම වැඩසටහනට අදාළව රුපියල් 37,395,922.00 ක පමණ බිල්පත් ගෙවීමට ඇත. අවශ්‍ය අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතය. මෙම වැඩසටහන 2019 සිට අත්හිටුවා ඇත.

සටහන 15 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ආයතනය එහි සාමාන්‍ය කටයුතුවලදී ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම් පහත පරිදි වේ. නිර්වචනය කර ඇති පරිදි සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු සිදු කරයි. ඒවායේ විස්තර පහත වාර්තා කර ඇත.

(1) ප්‍රධාන කළමනාකරණ පාර්ශව සමග ගනුදෙනු

ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට ආයතනයේ ක්‍රියාකරකම් පරිපාලනය කිරීමේ හා කළමනාකරණය කිරීමේ බලය හා වගකීම ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ඔහු මණ්ඩලයේ ලේකම්වරයාද වේ. ඒ අනුව, ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් (KMP) ලෙස හඳුනාගෙන ඇත. ප්‍රධාන කළමනාකරණ පාර්ශව වෙත ගෙවන ලද දීමනා පහත පරිදි වේ.

නම	තනතුර	දීමනා (රු)	
		රැස්වීම් දීමනා (රු)	මාසික වැටුප/දීමනා (රු)
2024/01/01 දින සිට 2024/08/13 දින දක්වා			
විනෝද් කුමාර් මුණසිංහ	2024 සැප්තැම්බර් මාසයේදී ඉල්ලා අස්විය.	-	1,199,380
චන්ද්‍රා වික්‍රමසිංහ	2024.11.12 දින සභාපති ධූරයට පත් කර ඇත.	-	120,000
එම්.එල්.ගම්මම්පිල	කළමනාකරණ මණ්ඩල සාමාජික	47,940	-
ඩී.ඒ.පී.අබේසේකර	සාමාජික	47,940	-
ඩී.ඒ.පී.එස්.සමන් කුමාරි	සාමාජික	55,930	-
හස්නා සේගු	සාමාජික	23,970	-
ජයන්ත ජයමාන්න	සාමාජික	47,940	-
මුරුගන් සච්චානන්දන්	සාමාජික	72,380	-
සිලරත්න සෙනරත්	සාමාජික	39,950	-
සී.එම්.පී.ජේ.තිලකරත්න	සාමාජික	15,980	-

ඉහත සඳහන්කර ඇති ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් සිදුකරන ලද ගණුදෙනුවලට, අමතරව සම්බන්ධිත පාර්ශවයන් සමග සිදුකරන ලද වෙනත් ගණුදෙනු නොමැත.

පසුගිය වසර දහයක වැදගත් මූල්‍ය විස්තර

විස්තරය	2015 (රු.)	2016 (රු.)	2017 (රු.)	2018 (රු.)	2019 (රු.)	2020 (රු.)	2021 (රු.)	2022 (රු.)	2023 (රු.)	2024 (රු.)
ආදායම්										
සාමාජිකත්ව දීමනා ලැබීම්	57,366,242	76,342,242	59,791,393	87,539,810	93,925,419	69,281,000	78,293,909	65,509,000	50,203,000	-
පුහුණු වැඩසටහන් වලින් ලද ආදායම්	-	-	-	-	-	16,382,450	22,732,875	103,597,400	173,838,925	260,029,265
අමාත්‍යාංශ ප්‍රදාන	14,486,667	-	5,000,000	49,887,161	5,773,800	-	-	-	-	-
වෙනත් ආදායම්	10,979,429	10,000,383	16,918,441	44,344,097	44,112,967	2,469,923	2,374,347	9,102,478	22,184,662	25,152,028
මුළු ආදායම්	82,832,338	86,342,625	81,709,834	181,771,068	143,812,186	88,133,373	103,401,131	178,208,878	246,226,587	285,181,293
වියදම්										
පරිපාලන වියදම්	28,223,041	34,503,661	70,633,623	65,311,243	73,467,406	69,896,731	77,188,762	82,361,401	82,310,559	76,515,869
පුහුණු වැඩසටහන් සඳහා වියදම්	36,866,135	28,512,310	65,224,443	75,608,626	68,224,969	10,274,234	40,055,155	48,231,241	70,017,663	95,157,152
වෙනත් වියදම්	95,348	192,250	5,592,959	-	-	-	-	-	-	-
මුළු වියදම්	65,184,524	63,208,221	141,451,025	140,919,869	141,692,375	80,170,965	117,243,917	130,592,642	152,328,222	171,673,021
මෙහෙයුම් ලාභය/ අලාභය	17,647,814	23,134,404	- 59,741,191	40,851,199	2,119,811	7,962,408	13,842,786	47,616,236	93,898,365	113,508,272
ක්ෂය වියදම්	- 52,500	- 53,632	- 68,641	- 54,514	- 113,639	- 15,540	- 15,450	- 25,850	- 1,400,199	- 555,871
බදු පෙර ලාභය/ අලාභය	17,595,314	23,080,772	- 59,809,832	40,796,685	2,006,172	7,946,868	13,858,236	47,590,386	92,498,166	112,952,401
ස්ථාවර වත්කම්	44,475,483	63,763,499	42,090,735	39,312,402	88,653,880	47,284,358	41,066,102	32,820,028	50,001,308	58,446,154

PAF/C/NILET/FS/01/24/01 2025 අගෝස්තු දින

සභාපති
ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ ("ආයතනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියළුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය වසරේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත් ආයතනය විසින් ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.7,537,035 ක් වූ පාරිතෝෂික වෙන් කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.7,956,098 ක් වූ ස්ථාවර තැන්පතු පොලිය ප්‍රාග්ධනීත නොකිරීම, රු.2,218,273 ක් වූ පොලිය ගිණුම්වලින් අත්හැර තිබීම හා රු.783,051 ක් ස්ථාවර තැන්පතු ගිණුමේ වැරදි ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආයතනයේ ස්ථාවර තැන්පතු ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතු 06 ක සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම හඳුනා ගැනීමේදී රඳවා ගැනීමේ බදු අඩු කළ ශුද්ධ පොලිය, පොලී ආදායම ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු.479,482 කින් ආදායම හා රඳවා ගැනීම් බදු අඩුවෙන් දැක්වුණි. තවද, 2024 මැයි 29 දින කල්පිරුණු ස්ථාවර තැන්පතුවකට අදාළ රු.2,361,629 ක පොලී ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) ආයතනයෙන් ඉවත්වී ගිය නිලධාරීන් කිහිපෙනෙකුට ගෙවිය යුතු රු.1,393,635 ක් වූ පාරිතෝෂික, ජංගම වගකීම් යටතේ ගෙවියයුතු පාරිතෝෂික ලෙස දක්වා නොතිබීම සහ සේවයෙන් ඉවත් වූ නිලධාරියෙකුගෙන් අයකර ගත් උත්සව අත්තිකාරම් රු.50,000ක් උත්සව අත්තිකාරම් ගිණුමට බැර නොකර පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමට බැර කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීම රු.1,443,635 කින් වැඩියෙන් දැක්වුණි.

(ඊ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව 2024 වර්ෂයේ පාඨමාලා ආදායම රු.260,029,265 ක් වුවත්, ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව එය රු.204,628,383 ක් වූයෙන් රු.55,400,882 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති විධානයට යොමුව	අනුකූල නොවීම
(අ)	2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 9(ඇ) වගන්තිය, 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමණාකරන සේවා චක්‍රලේඛයේ II ඡේදය සහ 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය	පනතට අනුව කාර්ය මණ්ඩලයේ පත් කිරීම් හා විනය පාලනය පිළිබඳ බලධාරියා අධ්‍යක්ෂ ජනරාල්වරයා වුවද, ආයතනයේ සභාපතිවරයා විසින් 2021 සහ 2022 වර්ෂවල නිලධාරීන් 8 දෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා බඳවාගෙන තිබුණු අතර, ඔවුන්ට 2024 වර්ෂයේදී රු.3,433,086 ක් දළ වැටුප් ලෙස ගෙවා තිබුණි.
(ආ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) හා 102 වගන්ති	ආයතනය ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී	ආයතනයේ බැංකු ගිණුමට සෘජුවම මුදල් බැර

	ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 383	කරන අවස්ථාවලදී ගිණුම් කටයුතු සඳහා ක්‍රියා කිරීමට හැකි පාලන පිළිවෙත් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුළ බැංකු ගිණුම වෙත සෘජුව ලැබුණු රු.58,583,495ක තැන්පතු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.
(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය	වර්ෂය අවසන් වී දින 60ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ දින 40 ක ප්‍රමාදයක් සහිතවය.
(ඉ)	2015 මැයි 25 දිනැති අංක PED/01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 වගන්තිය	නිල වාහනයක් ලබා දී ඇති නිලධාරීන්ට හා ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන්ට සංචිත වාහන හෝ වෙනත් කාර්යාලීය වාහන භාවිතා කළ නොහැකි වුවත්, ආයතනයේ හිටපු සභාපතිවරයා 2022 අප්‍රේල් සිට 2023 ඔක්තෝබර් දක්වා අවස්ථා 44 කදී කාර්යාලීය සංචිත වාහන භාවිතා කරමින් කි.මී.19,342 ක් ධාවනය කර තිබූ අතර මීට අදාල අලාභය ගණනය කර අයකර ගැනීමට 2024 වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා තෙවන පාර්ශවයක් වෙතින් ඉටුකර ගැනීමේදී 2022 සිට 2024 දක්වා ආයතනය වෙත අයවිය යුතු ආන්තිකය ලෙස පවතින එකතුව රු.16,360,500 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේ දී රු.2,024,000කට මිලදීගෙන තිබූ බහුකාර්ය මුද්‍රණ යන්ත්‍රය අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තාක්ෂණික පිරිවිතර සකස් නොකර මිලදී ගැනීම හේතුවෙන් වර්තමානය වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සම්පත්දායකයන් සඳහා ගෙවිය යුතු ගාස්තු රු.6,247,745ක් වර්ෂ 2 සිට 6 දක්වා කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) ණයහිමියන් යටතේ දක්වා ඇති 2022 වර්ෂයේ සිට පැවතුණු පෙළපොත් සහ ගුරු අත්පොත් පිළියෙල කිරීම සඳහා ගෙවිය යුතු රු.423,000ක මුදල සමාලෝචිත වර්ෂයේ ද නිරවුල් කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

011 286420

Nilet3050@gmail.com

www.nilet.gov.lk

321/1 හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
No:321/1, High Level Road, Makubura, Pannipitiya
321/1, ஹைலெவல் வீதி, மாக்கும்புற, பன்னிப்பிட்டிய

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
National Institute of Language Education and Training